කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

9 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව I , II | කාලය පැය 1 1/2

නම : .................................................................................................................

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නාට්‍යයක් නැරඹීමෙන් මූලිකව ලැබෙන්නේ.
 1. උපදේශයකි 2. රසයකි 3. දැනුමකි 4. පණිවුඩයකි

02. ජන කතාවක දකිය නොහැකි ලක්ෂණයකි,
 1. ගැඹුරු භාෂාව 2. විවිධ චරිත 3. අනුකරණය 4. කුතුහලය

03. " ආරූඪ වීම" යන්නට සමාන අරුත් දෙන පදයකි,
 1. අභිනය 2. සමාරෝපය 3. අනුකරණය 4. අනුරූපණය

04. ජන ගී ශබ්ද නගා ගායනා කිරීමෙන් ප්‍රගුණ කළ හැකි රංග අභ්‍යාසය වන්නේ,
 1. කටහඬ 2. චිත්ත ඒකාග්‍රතාවය 3. සංවේදන 4. ශිථිලකරණය

05. නාට්‍යයක සිදුවීම් පෙළගස්වා ඇති ආකාරය හඳුන්වන්නේ,
 1. පරිකල්පනය 2. සමාරෝපය 3. කතාවින්‍යාසය 4. ශෛලිය

අංක 06 සිට 10 දක්වා හිස්තැනට අදාල නිවැරදි පිළිතුර යොදන්න

06. අභිරූපණයේදී ............................................ අභිනය භාවිතා නොවේ

07. මහමාවතේ හෝ පොදු ජනයා රැස්වන ඕනෑම තැනක රඟ දක්වන නාට්‍ය ........................................................වේ

08. තොප්පි වෙළෙන්ඳා නාට්‍ය නිෂ්පාදනය කළේ ..............................................ය

09. ශිථිලකරණය මගින් නළුවාගේ ශරීරය ............................................... වේ.

10. වේෂ භූෂණ යනු නළු නිළියන් භාවිතා කරන ...................................................... වේ.

හරිනම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණු ද වාක්‍ය ඉදිරියේ ඇති වරහන තුල ලකුණු කරන්න.

11. පසුබිම් සංගීතය ආනුෂාංගික කලාවක් නොවේ. ( )

12. සුගතපාල ද සිල්වා අපේ කට්ටිය නමින් නාට්‍ය කණ්ඩායමක් නිර්මාණය කළේය ( )

13. හුණුවටයේ කතාව නාට්‍ය ස්වතන්ත්‍ර නිර්මාණයකි ( )

14. පොර පොල් ගැසීම රංග ක්‍රීඩාවක් ලෙස ගත හැකිය. ( )

15. මූදු පුත්තු නාට්‍යයට පාදක වූ විදේශ නාට්‍යය ද ප්‍රොපෝසල්ය ( )

අග ඇති ගොනුවෙන් තෝරා හිස්තැන් පුරවන්න.

16. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයක් වන්නේ ................................................... ය.

17. ......................................... ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කළ අයෙකි.

18. නළුවාගේ බාහිර සමාරෝපය සඳහා ......................................... බලපෑමක් කරයි.

19. .............................................. චුල්ල ධනුද්ධර ජාතකය පදනම් කරගත් නාට්‍යයකි.

20. ...................................... ආහාර්ය අභිනයට අයත්ය.

( සයිමන් නවගත්තේගම, වේෂ භූෂණ, නාට්‍යෝපකරණ, මනමේ, සිංහබාහු )

## II කොටස

ප්‍රශ්න අංක 01 ඇතුළු ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01. 1. කදාවළලු නාට්‍යය රචනා කළේ කවුරුන්ද?

2. මෙම නාට්‍යයට පදනම් වූ ජාතක කථාව කුමක්ද?

3. සිටුපවුල දුප්පත් වුයේ කුමක් නිසාද?

4. මෙම නාට්‍යයේ යහපත් වෙළෙන්දාගේ නම කුමක්ද?

5. මෙම නාට්‍යයේ තේමාව කුමක්ද?

(ලකුණු 10 යි)

02. 1. අභිනය යනු කුමක්ද? (ලකුණු 04)

2. අභිනය නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

03. 1. රංග ක්‍රීඩා දෙකක් නම් කර ඉන් එකක් සිදු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

2. රංග ක්‍රීඩා වලින් ලැබෙන ප්‍රයෝජන 4 ක් ලියන්න (ලකුණු 06)

04. 1. නාට්‍ය ශෛලින් නම් කර කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 05)

2. පරිවර්තන අනුවර්තන ස්වතන්ත්‍ර නාට්‍ය වලට නිදසුන් සපයමින් විස්තර කරන්න. (ලකුණු 05)

05. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන විස්තර කරන්න.

1. දයානන්ද ගුණවර්ධන

2. අංග රචනය

3. වීදි නාට්‍ය කලාව

4. සුගතපාල ද සිල්වා

(5x2 ල. 10 )